# මිනිපිරිය ඇවිල්ලා අවුරුද්ද ගෙනැල්ලා

සෙවෙණි කුස පුදා සිටි සෙනෙහෙ බර උහුල්ලා
දුවට දී සැහැල්ලුව සමග පැතු සියල්ලා
පරපුරට නව පදවි තිළිණයට ගෙනැල්ලා
මිනිපිරිය අවුරුද්ද රැගෙන ගෙට ඇවිල්ලා

ලොකු පුතා පිය පදවි ලැබ නගන හසරැළි
දියණි අම්මා කෙනෙකු ලෙස ලබන සැලකිලි
බිරිය ආඩම්බරෙන් මිනිපිරිය ළඟ වෙලී
මට උරුම පදවි පිරිනමා නෙක සැනකෙලී

පුංචි තොල් මතට සුරඟන ලොවක සිනාපොද
නගා අවුරුදු කුමරි සුබ මොහොත බලා හිඳ
වැඩිය යුරු අපූරුයි පුරවමින මගේ හද
කෙවිලි නද කවි නිවසකට ඔයා ගෙනාවද

සුබ නැකැත් වෙලාවට මේසයෙහි විසිතුරු
තබා පහනක් ලෙසට මිනිපිරිය පිවිතුරු
අවුරුද්ද ඉඳුල් කර පැතුම් මැද පියකරු
හිතෙන් ඔන්චිලි බඳිමි එන වසර එනතුරු

මුදු කැකුළු රත්තරන් සිනාකැන් ගෙය පුරා
වපුරමින් නිවහනෙන් ලැබෙන සිහසුන අරා
ඔයා එන්නැයි කීව මලනුවන් එනතුරා
ඔට්ටුවට දුවමු අපි ගෙයි සැවොම පිරිවරා

තිසරණින් සත්සරින් වයා සුමියුරු වෙණක්
අවුරුද්දෙ කිරිබතක සුවඳ දී හැම දිනක්
නැණගුණය විහිදමින් එළිය කර නිවහනක්
මගෙ දැයට මිනිපිරිය විය යුතුය සිතුමිණක්

කාව්‍ය කලාශූරි **සනත් පියසේන**

## කුහරය

කළු කුහරයකි ජීවිතය
සියළු දේ
ඇතුළට ගෙන වනසන-
අඳුර.
පිළිකුල.
අදෝනා.
කඳුළු.

අළුත් වෙයි
කැපුම් තුවාල
දිනපතා-
කරවටක්
කරදර ගැඹරේ
මැරී මැරී
නොමැරී ඉමු.

බඩු මිල.
යුද්ධය.
රමණය.

කුහරය පලා
මතුවන
හීන්
තරු එළියක් වෙද
තව දුරටත්
ආදරය නමින?

KOOMBIYA

## වසන්තය?

පැතු පැතුමන් බිඳ වැටී යයි
දුටු සිහිනය බොඳ වෙලා යයි
ජීවිතය මගෙ නැවතී ලයි
අසරණයි මා අසරණයි

හෙළන්නට කඳුළැලි ද නැත්තේ
සිතන්නට සිතුවිලි ද නැත්තේ
විඩාබර සිත හති වැටී ඇත්තේ
කියනු වසන්තය තව දුරද ඇත්තේ

ප්‍රේමලතා රත්තනායක
ජර්මනිය

ගොඩවන්න

www.ketapathpawra.com
www.thisara.com
www.sannasa.net

බැසිල් ඇන්තනී - ඩුබායි

## දැයේ පිරිහීම

විදුණැන පොතේ කොළ විසිරී කසල ගොඩේ
බුදු බණ පොතේ කොළ ඔතලා මසල වඩේ
මුදුගුණ සපිරි වියතුන්ටත් හැදිල ලෙඩේ
විදු සක්විතිගෙ පොත් කිරෙනව කඩල කඩේ

බුදු ගුණ ගැයෙන විට බයිලා තාල වල
නව ගුණ වැල චිතේ අගනුන් මාල වල
යහ ගුණ තැන නොතැන අවතැන් වෙලා බල
දුර් ගුණ රජ වූ ලක කඩතුරු හැරන් බල

දරුවන් උගනි බයිලා දැක කැරෝකිය
දැනුනෙද වියත් නිර්මන් වල අහේනිය
සංකර සිරිත් ගෙන බටහිර යුරෝපිය
දැල් රෙදි කඩත් අඟනු විලිබිය වසාලිය

# මතකද

පෝයදාට විහාරයෙන් එන සණ්ඨා හඬ මතකද
පවුලේ හැම දෙන සුදු ඇඳුමින් හැඩ වුණ හැටි මතකද
තෙල් මල් ගෙන විහාරයට පියවර නැගුවා මතකද
අතර මගදි හිතවතුන්ගෙ සැප දුක් ඇහුවා මතකද

අරමට යන ගුරු පාරෙහි දෙපස තිබුණු වෙල මතකද
ගොයම් කරල් සිප ගෙන එන සිසිල් සුළං රැල් මතකද
වෙල කෙළවර කඳුවැටියෙන් හිරු බැස ගියහැටි මතකද
කුරුළු රෑන කැදලි වලට පියඹා ගිය හැටි මතකද

අරමෙහි පියගැට පෙළ ළඟ ඇති අරලිය ගස් මතකද
ඒ අරලිය ගස් අතරින් සඳ රැස් වැටුණා මතකද
විහාර බිම වටා තිබුණු සමන් පිච්ච වැල් මතකද
පිච්ච සුවඳ අරලිය සුවඳට මුහු වුණු හැටි මතකද

ගෙන ගිය මල් පැන් ඉහලා පිළියෙල කල හැටි මතකද
පළමුවෙන්ම චෛත්‍යයට ඒ මල් පිදුවා මතකද
දෙවනුව බෝධිය තෙවනුව බුදු ගෙය වැන්දා මතකද
බොදු බැතියෙන් හිත පිරිලා උතුරා ගිය හැටි මතකද

සියළු දෙනම වැලි මළුවෙහි පෙළකට හිටියා මතකද
දැල් වූ පහන් හඳුන්කූරු පාට පාට මල් මතකද
බුදුන් පුදට ගෙන ආ දෑ අතිනත යැව්වා මතකද
සාධු හඬින් විහාරයම නිම්නද දුන්නා මතකද

පොඩි හාමුදුරුවො සැමට පන්සිල් දුන්නා මතකද
ගාථා කියා බුදු සාධුට තෙල් මල් පිදුවා මතකද
ලොකු හාමුදුරුවො කාටත් ඔවදන් දුන්නා මතකද
වැන්දම සුවපත් වේවා කියා කිව්ව හැටි මතකද

සැනසිල්ලේ සඳ එළයේ නිවසට ආ හැටි මතකද
හඳ එළයෙන් වෙල් යායයි කඳුයි දැක්ක හැටි මතකද
පෝ දින රෑ රේඩියෝවෙ පිරිත් ඇහුව හැටි මතකද
ඒ සුමධුර පිරිත් හඬට නිදි සුව ලැබුවා මතකද

*ගාමිණී ලක්ෂ්මන් ගමගේ*


